ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය
இலங்கை தேசிய கிறிஸ்தவ மன்றம்
National Christian Council of Sri Lanka

## ශ්‍රී ලංකාවේ වත්මන් අර්බුදය පිළිබඳව වන
## ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ප්‍රකාශය

අරලියගහ මන්දිරයේ සහ ගාලුමුවදොර පිටියේ පැවති සාමකාමී සිවිල් විරෝධතාවලට එරෙහිව එල්ල කරනු ලැබූ බියගුලු හා ම්ලේච්ඡ ප්‍රහාරය හේතුවෙන්, බෞද්ධ භික්ෂුවක් සහ ක්‍රිස්තියානි පූජකවරුන් දෙදෙනෙකු ඇතුළු විරෝධතාකරුවන් බොහෝ දෙනෙකු තුවාල ලබා රෝහල් ගත කරන්නට වීම, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (NCCSL) නිර්ලජ්ජිතව හෙළා දකියි.

සිවිල් වැසියන්ගේ සාමකාමී රැස්වීම්වලට එරෙහි කිසිදු ප්‍රචණ්ඩ ක්‍රියාවක් අප අනුමත නොකරන අතරම, රටේ පුරවැසියන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උල්ලංඝනය වන එවැනි නීති විරෝධී ක්‍රියාවන් හිතාමතා සැලසුම් කළ, උසිගැන්වීම් සහ ප්‍රවර්ධනය කළ පුද්ගලයන්ට එරෙහිව වහා පරීක්ෂණයක් පවත්වා නීතියට අනුව නිසි දඬුවම් දෙන ලෙස අපි උදක්ම ඉල්ලා සිටිමු. එමෙන්ම දින 30 කට අධික කාලයක් පුරා ප්‍රජාතන්ත්‍රවාදීව දිවයිනේ සෑම ප්‍රදේශයකම සහ ගාලුමුවදොර පිටියේ පැවැත්වෙන සාමකාමී විරෝධතා සඳහා වන පුරවැසි 'අයිතිය' තහවුරු කරන ලෙස අපි පොලිසියෙන්, විශේෂ කාර්ය බළකායෙන් (STF) සහ ත්‍රිවිධ හමුදාවෙන් ඉල්ලා සිටිමු.

කිසිදු ආකාරයක හිංසාකාරි ක්‍රියාවක්/ප්‍රචණ්ඩ ක්‍රියාවක් අපි අනුමත නොකරමු. සාමයට ලැදි පුරවැසියන් හට එරෙහිව සිදු කරන ලද ප්‍රචණ්ඩත්වයන්ට, ප්‍රතිප්‍රහාර එල්ල කළ මහා ජනයාගේ කෝපය සහ වේදනාව අපි පිළිගනිමු. කෙසේ වෙතත්, රට වඩා ගැඹුරු අර්බුදයකට ගෙන යන මිනිස් ජීවිත හා දේපළවලට අලාබ-හානි කිරීමෙන් වළකින ලෙස අපි සියලු ජනතාවගෙන්ම ඉල්ලා සිටිමු.

අග්‍රාමාත්‍යවරයාගේ ඉල්ලා අස්වීම අපි සාදරයෙන් පිළිගන්නා අතර ජනාධිපතිවරයාගෙන් ද ඉල්ලා සිටින්නේ එය අනුගමනය කරමින් ඉල්ලා අස්වෙන ලෙසයි. අප රටේ පෙර නොවූ විරූ ආර්ථික හා දේශපාලන අර්බුදය විසඳීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා ගෞරවනීය හා නොකිළිටි දේශපාලන නායකයින්ගේ සහ කැපවූ වෘත්තිකයන්ගේ සහභාගීත්වයෙන් අන්තර්වාර රජයක් පිහිටුවීමට අපි ඉල්ලා සිටිමු. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මෙන්ම පාලනයේ 'ව්‍යුහාත්මක පද්ධති වෙනසක්' පිළිබඳව වන ජනතාවගේ පුළුල් අදහස් හා ඉල්ලීම් මනසේ තබා ගනිමින් මහ මැතිවරණයක් පැවැත්වීමට කටයුතුකරන ලෙස ද අපි ඉල්ලා සිටිමු.

අවසාන වශයෙන්, සාමකාමී මාර්ගවලින් පැහැදිලි වෙනසක් අත්කර ගත හැකි බව අපගේ යාච්ඤාවයි. පවතින ඉතා නොසන්සුන් සහ සියුම් තත්ත්වයන් මධ්‍යයේ සන්සුන්ව, සංයමය සහ ඉවසීම පෙරදැරිව කටයුතු කරන ලෙස අපගේ ජනතාවගෙන් ඉල්ලා සිටිමු.

#368/6, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka.
Telephone: +94 (11) 2671723 Fax: +94 (11) 2671721
E-Mail: info@nccsl.org | Website: www.nccsl.org

අත්සන් කරනු ලැබුයේ:

අත්සන් කරන ලද්දේ:

**සාමාජික සභාවන්**

- ගරු ඩබ්ලිව්. පී. එබනීසර් ජොසප් දේවගැතිතුමා - සභාපති ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය සහ සභාපති ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාව
- අතිගරු දූෂාන්ත රුද්‍රිගු රදගුරුතුමා - ලංකා සභාව කොළඹ දියෝකීසිය
- අතිගරු කීර්තිසිරි ප්‍රනාන්දු රදගුරුතුමා - ලංකා සභාව කුරුණෑගල දියෝකීසිය
- ගරු හේෂාන් ද සිල්වා දේවගැතිතුමා - සභාපති ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය
- ගරු සමන් පෙරේරා දේවගැතිතුමා - සභාපති ශ්‍රී ලංකා ප්‍රෙස්බිටේරියන් සභාව
- අතිගරු ධර්මාචාර්ය ඩැනියල් එස්. තියාගරාජා- රදගුරුතුමා දකුණු ඉන්දියානු සභාව - යාපනය දියෝකීසිය
- ගරු ෂර්ලි එස්. ෆේබර් දේවගැතිතුමා - සභාපති ක්‍රිස්තියානි රෙපරමාදු සභාව
- කර්නල් නිහාල් හෙට්ටිආරාච්චි දේවගැතිතුමා - ප්‍රාදේශීය භාර මූලිකතුමා ගැලවීමේ හමුදාව
- ගරු ධර්මාචාර්ය ක්‍රිසෝ හැන්ඩි දේවගැතිතුමා - සභාපති ලංකා දේව සභා සංගමය
- ගරු හරීම් පිරිස් දේවගැතිතුමා -උප සභාපති/වැඩ බලන සභාපති සිව් චතුරශ්‍ර සුභාරංචි සභාව
- ගරු මැක්ස්වෙල් ඩොස් දේවගැතිතුමා - මහා ලේකම් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

**සාමාජික සාමයික ආයතන**

- ශ්‍රී ලංකා තරුණ ක්‍රිස්තියානි සංගමය
- තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය
- ශ්‍රී ලංකා බයිබල් සංගමය
- ක්‍රිස්තියානි සාහිත්‍ය සංගමය
- ශ්‍රී ලංකා ශිෂ්‍ය ක්‍රිස්තියානි ව්‍යාපාරය
- ජීවිතාලෝකය
- ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය පිළිමතලාව

**2022, මැයි මස 11වැනි දාය**

#368/6, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka.
Telephone: +94 (11) 2671723 Fax: +94 (11) 2671721
E-Mail: info@nccsl.org | Website: www.nccsl.org